ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 2018.11.27 |

ශ්‍රී ලංකා සංඥා බළකායේ 75 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීම

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් පුරා වසර 75 ක් මුළුල්ලේ රට වෙනුවෙන් කරන ලද සේවාව ඇගයීම හා එහි 75 වන සංවත්සරය සැමරීම නිමිත්තෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු. 10 ක මුහුණත වටිනාකමක් සහිත සංසරණය සඳහා භාවිතා කරනු ලබන සමරු කාසියක් නිකුත් කරන ලදී. මෙහි පළමු කාසිය 2018.11.27 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු අග්‍රාමාත්‍ය හා මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා වෙත නිල වශයෙන් පිළිගන්වනු ලැබීය.

මෙම කාසිය බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ඉදිරියේදී සංසරණයට නිකුත් කරනු ලබන අතර අනෙකුත් ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සමග ගෙවීම් සඳහා භාවිතා කළ හැකි වේ.

කාසිය පිළිබඳ විස්තර:

| | |
|---|---|
| මුහුණත වටිනාකම | රු.10 |
| කාසි වර්ගය | සංසරණය සඳහා භාවිතා කරනු ලබයි |
| නිකුතුව | කාසි 5,000,000 |
| ලෝහය | මල නොබැඳෙන වානේ – AISI 430 |
| විෂ්කම්භය | මි.මී. 26.40 |
| ඝනකම | මි.මී. 1.80 |
| හැඩය | වටකුරු |
| දාරය | කට්ට 11 ක් සහිත |

| මුහුණත | පිටුපස |
|---|---|
|  |  |
| කාසිය මධ්‍යයේ හර්මීස් දෙවියන්ගේ රුව මගින් ක්ෂණික පණිවිඩ හුවමාරුව තුලින් බොහෝ යුධ ජයග්‍රහන ලබා ගැනීමට ශ්‍රී ලංකා සංඥා බලකායේ මැදිහත්වීම පිළිබිඹු කරයි. ගෝලීය වශයෙන් දැනුම්වත් වීමේ අදහස සහිතව පසුබිමින් ඇති ලෝක ගෝලය මගින් පෙන්නුම් කරනු ලබන්නේ ශ්‍රී ලංකා සංඥා බළකාය සිය තාක්ෂණය හා පරමාදර්ශයන්ගෙන් නිරන්තරයෙන් වර්ධනය වන බවය. ලාංඡනය දෙපස ඇති තරු හය මගින් අණ දීම, පාලනය, සන්නිවේදනය, පරිගණක, සයිබර් සහ රහස් තොරතුරු යන සාධක අනුපූරණය කරනු ලබයි. ලාංඡනයට ඉහළින් ඇති ධර්මචක්‍රය මගින් ශ්‍රී ලංකා සංඥා බලකායේ විනය සහ ගෞරවය අවධාරණය කරනු ලබයි.<br><br>ලාංඡනයට පහළින් මෙම කාසිය ශ්‍රී ලංකා සංඥා බළකායේ 75 වන සංවත්සරය සැමරීම නිමිත්තෙන් නිකුත් කරනු ලබන බව දැක්වේ. කාසියේ පහළින් 2018 වර්ෂය දක්වා ඇත. කාසිය පරිධියේ රටෙහි නම ඉංග්‍රීසි, සිංහල හා දෙමළ භාෂාවලින් දක්වා ඇත. | කාසිය මධ්‍යයේ මුහුණත වටිනාකම විශාල ඉලක්කමෙන් ද සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වචනයෙන් ද දක්වා ඇත. කාසිවල පරිධියේ නෙළුම් මල් පෙති මෝස්තරයක් යොදා ඇත. |

වැඩි විස්තර සඳහා;


ශ්‍රී ලංකා මහ බැංකුව : දුරකථන අංකය : 0112477587/ 0112477369
විද්‍යුත් තැපැල : currency@cbsl.lk

ශ්‍රී ලංකා සංඥා බලකාය : දුරකථන අංකය : 0112342818/ 0112855361
විද්‍යුත් තැපැල : slscanniversary@army.lk

අධිකාරි
ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත
කොළඹ 01
ශ්‍රී ලංකාව.